(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 402.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2014 ඔක්තෝබර් මස 27 වැනි සඳුදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2665/'12

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි පන්සල්, කෝවිල්, පල්ලි හා මුස්ලිම් දේවස්ථාන ඇතුළු ආගමික සිද්ධස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සකස් කර ඇති රජයේ ආධාර වැඩසටහන් කවරේද;

(ii) එම ආධාර වැඩසටහන්වලට අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3245/'12

2.

ගරු රවී කරුණානායක මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) තැපැල් දෙපාර්තමේන්තුවට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3720/'13

3.

ගරු අනුර දිසානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වර්ෂ පහ තුළ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා ආනයනය කරන ලද දුම්රිය එන්ජින් හා මැදිරි සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා මිලදී ගනු ලැබූ රට හෝ රටවල් කවරේද;

(iii) මිලදී ගැනීමේදී අනුගමනය කරන ලද පටිපාටිය කවරේද;

(iv) ඒවා මිලදී ගැනීම සඳහා මුදල් සම්පාදනය කරගත් ආකාරය කවරේද;

(v) මුදල් සම්පාදනය වෙනුවෙන් දේශීය හෝ විදේශීය ණය ලබාගෙන තිබේද;

(vi) එසේ නම්, එම ණය ප්‍රමාණයන්, පොලී අනුපාතිකයන් සහ අදාළ කොන්දේසි කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ආනයනය කරන ලද ඉහත සඳහන් එන්ජින් හා මැදිරිවල අවශ්‍ය තාක්ෂණය නොමැති බව හෙළිවී තිබේද;

(ii) ඒ සඳහා බලපා ඇති හේතු කවරේද;

(iii) එම තාක්ෂණික දෝෂ සහිත දුම්රිය මැදිරි හා එන්ජින් මිලදී ගැනීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා තිබේද;

(iv) එසේ නම්, එම පරීක්ෂණය අනුව ඉහත මිලදී ගැනීම් සඳහා වගකිව යුතු අය කවුරුන්ද;

(v) ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3830/’13

4\. ගරු බුද්ධික පතිරණ මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හක්මණ - මාතර මාර්ගය පුළුල් කර කාපට් කිරීම සඳහා කටයුතු කරන්නේද;

(ii) එම මාර්ගය පුළුල් කර සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) ඒ සඳහා අරමුදල් සපයා ගන්නා මූලාශ්‍ර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) මාතර - හක්මණ මාර්ගය, ගොඩගම - බෙලිඅත්ත අධිවේගී පිවිසුම් මාර්ගය යැයි පවසමින් පුළුල් කරන බව දන්නේද;

(iii) එම මාර්ගය පුළුල් කර සංවර්ධනය කරන්නේ නම්, මීට වඩා වැඩි ප්‍රදේශයක් ආවරණය වන ගොඩගම අකුරැස්ස මාර්ගයද සංවර්ධනය නොකිරීමට හේතු කවරේද;

(iv) මීට වර්ෂ 7-8 කට පෙරද කාපට් කරන ලද එම මාර්ගය, මාර්ග සංවර්ධන අධිකාරියේ ඉහළ නිලධාරීන්ගේ වැරදි වාර්තා පදනම් කරගෙන නැවතත් පුළුල් කිරීමට කටයුතු කරන බව දන්නේද;

(v) කාපට් කරන ලද මාර්ගයක් නැවත කාපට් කිරීමට කටයුතු කිරීම මුදල් නාස්ති කිරීමක් නොවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4176/'13

5\.
ගරු රෝසි සේනානායක මහත්මිය,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යටතේ පාලනය වන කොළොන්නාව ප්‍රධාන සේවා ස්ථාන උපකරණ වැඩපොළෙහි අධීක්ෂණ කටයුතු සිදුවන්නේ කුමන නිලධාරියෙකු යටතේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2005 වර්ෂයේ සිට 2013 වර්ෂයේ ජුනි මාසය දක්වා කාල සීමාව තුළ ඉහත වැඩපොළෙහි,

(i) පොම්ප මිලදී ගැනීමට, අමතර කොටස් මිලදී ගැනීමට සහ ඉන්ධනහල් අලුත්වැඩියාවට වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අමතර කොටස් විකිණීම තුළින් උපයන ලද මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2013 වර්ෂයේ ජුනි මාසය අවසන් වන විට එම වැඩපොළෙහි සේවයේ නියුතුව සිටි සේවකයින් සංඛ්‍යාව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4584/'13

6\.
ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විදේශගත ශ්‍රමිකයින්ගේ දායක මුදලින් ක්‍රියාත්මක වන අනිවාර්ය රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදී ඇති බවත්;

(ii) ආරම්භයේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගින් ක්‍රියාත්මක කර පසුකාලීනව විදේශ රැකියා ඒජන්සි සමාගමක් වෙත පැවරූ එම රක්ෂණ කටයුතු එකී සමාගම විසින් තැරැව්කාර සමාගමක් මගින් එම්. බී. එස්. එල්. රක්ෂණ සමාගම වෙත පවරා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) විදේශ රැකියා ඒජන්සි සමාගම විසින් එකී තැරැව්කාර සමාගමේ සේවා ලබාගැනීම ඇරඹූ දිනය කවරේද;

(ii) විදේශගත ශ්‍රමිකයකුගෙන් අය කරන වාරිකයෙන් එම තැරැව්කාර සමාගම වෙත ගෙවනු ලබන ප්‍රතිශතය කවරේද;

(iii) මේ දක්වා එම සමාගම වෙත ගෙවා ඇති මුළු මුදල කොපමණද;

(iv) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් එම රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කළ විටදී තැරැව්කරුවෙකුගේ සේවය ලබාගත්තේද;

(v) තැරැව්කරුවෙකුගේ සේවය ලබා ගැනීමෙන් අත් වූ ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) තැරැව්කාර සේවා වෙනුවෙන් ගෙවූ ගාස්තු ලබා ගත් තැරැව්කාර සමාගම් නියෝජිතයා කවුරුන්ද;

(ii) එම නියෝජිතයා එකී ගාස්තු ගෙවන ලද මුළු කාල පරිච්ඡේදය මුළුල්ලේම එම සමාගමේ සේවයෙහි නිරතව සිටියේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4591/'13

7.

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂය තුළදී ශ්‍රී ලංකාවේ ශිෂ්‍ය ජනගහනයෙන් පාසල් හැර ගිය සංඛ්‍යාව කොපමණද;

(ii) එම දරුවන් පාසැල් හැරයාමට හේතු වූ කරුණු සොයා බැලීම සඳහා අධ්‍යයනයක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම අධ්‍යයනයට අනුව හඳුනාගෙන ඇති හේතු කවරේද;

(iv) හඳුනාගත් එම හේතු සඳහා පිළියම් යෙදීමට සහ පාසල් හැරයාමේ සංඛ්‍යාව අවම කිරීමට ගෙන යන වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සිසුන් පාසල් හැර යාම වැඩි වශයෙන් සිදුවන ප්‍රදේශ කවරේද;

(ii) එම ප්‍රදේශවල පාසල් හැර යාම, පොදු හේතුවලට අමතරව වෙනත් විශේෂ හේතු මත සිදුවන්නේද;

(iii) එසේ නම්, එම හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4673/'13

8.

ගරු පී. හැරිසන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් තනතුර දැරීම සඳහා තිබිය යුතු සුදුසුකම් කවරේද;

(ii) එම තනතුරේ සේවය කළ යුතු කාල සීමාවන් තිබේද;

(iii) එම තනතුර සඳහා ගෙවනු ලබන වැටුප කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) "වකුගඩු රෝගයට හේතු විය හැක" යන පදනම මත වර්තමාන පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉදිරි වර්ෂ දෙකක කාල සීමාව සඳහා ආනයනය අත්හිටුවා ඇති පළිබෝධ නාශක වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ආනයනය කිරීම නතර කරන ලෙස ලෝක සෞඛ්‍ය සංවිධාන මගින් ද ඉල්ලා ඇති පළිබෝධ නාශක කවරේද;

(iii) ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් රට තුළට ආනයනය නොකරන ලෙස ඉල්ලා ඇති පළිබෝධ නාශක ගෙන්වීම ආරම්භ කරනු ලැබූ වර්ෂය කවරේද;

(iv) දැනට රජය මගින් තහනමට ලක් කර ඇති පළිබෝධ නාශක වෙනත් නම් යටතේ ගෙන්වන බව දන්නේද;

(v) එසේ නම්, එවැනි කටයුතුවල යෙදෙන සමාගම්වලට එරෙහිව ගනු ලබන නීත්‍යානුකූල පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4754/'14

9.

ගරු අශෝක් අබේසිංහ මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දිවයින තුළ ඇති පොල් තෙල් කර්මාන්ත ශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින එම කර්මාන්ත ශාලා සංඛ්‍යාව කොපමණද;

(iii) 2005 වර්ෂයේ දී කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වූ පොල් කර්මාන්ත ශාලා සංඛ්‍යාව කොපමණද;

(iv) කුරුණෑගල දිස්ත්‍රික්කයේ දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින පොල් කර්මාන්ත ශාලා සංඛ්‍යාව කොපමණද;

(v) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පමණක් පොල් කර්මාන්ත ශාලා 80 ක් පමණ වැසී ගොස් ඇති බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4850/'14

10.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මූලික අවශ්‍යතා සපුරා ගැනීමට එක් පුද්ගලයෙකුට මසකට දැරීමට සිදුවන අවම වියදම මත පදනම්ව, ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සෑම මසකම දිස්ත්‍රික් දරිද්‍රතා රේඛාව ප්‍රසිද්ධ කරනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කොළඹ දිස්ත්‍රික්කය සඳහා පවතින නවතම නිල දරිද්‍රතා රේඛාව කවරේද;

(ii) ඉහත කී දරිද්‍රතා රේඛාව ගණනය කිරීමේදී පදනම් කරගනු ලබන "මූලික අවශ්‍යතා" කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4921/'14

11.

ගරු තිස්ස අත්තනායක මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 සහ 2014 වර්ෂයන්හි නීති විද්‍යාල ප්‍රවේශ විභාගය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව;

(ii) 2013 සහ 2014 වර්ෂවලදී නීති විද්‍යාලයට ඇතුළත් කර ගත් සිසුන් සංඛ්‍යාව;

(iii) 2014 වර්ෂයේ දී එක් එක් දිස්ත්‍රික්කයෙන් නීති විද්‍යාලය සඳහා බඳවා ගත් සිසුන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂය සඳහා නීති විද්‍යාලයට ඇතුළත් කර ගත් සිසුන් සංඛ්‍යාව විශාල වශයෙන් අඩු කර තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4958/'14

12.

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් සභාව මගින් පාලනය කරන පුත්තලම දිස්ත්‍රික්කයේ ඇති රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝහල් වෙතින් 2012 සහ 2013 වර්ෂවල දී ප්‍රතිකාර ලබා ගෙන ඇති බාහිර රෝගීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වයඹ පළාත් සභාව යටතේ පාලනය වන ඉහත අ(i) හි සඳහන් එක් එක් රෝහල සඳහා අනුමත වෛද්‍යවරුන්, හෙදියන්, සෞඛ්‍ය උපස්ථායකයින්, රෝහල් කම්කරුවන් හා අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව;

(ii) එම රෝහල්වල ඉහත තනතුරුවලට අදාළව මේ වන විට පවතින පුරප්පාඩු සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) ඉහත ආ (ii) හි සඳහන්වන පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5030/'14

13.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින බුලත් ගොවීන් සංඛ්‍යාව ආසන්න වශයෙන් කොපමණද;

(ii) වැඩි වශයෙන් බුලත් වගා කරනු ලබන ප්‍රදේශ කවරේද;

(iii) බුලත් අපනයනය කරනු ලබන ප්‍රධාන රටවල් කවරේද;

(iv) බුලත් අපනයනය තුළින් වාර්ෂිකව උපයනු ලබන විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) බුලත් වගාකරුවන්ට සහනාධාර ක්‍රමයක් යටතේ පොහොර ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) දේශීය වෙළඳපොළෙහි ඉතා කෙටි කාල පරාසයන් තුළ සිදුවන බුලත් මිල උච්චාවචනය වීම අවම කිරීමට සුදුසු ක්‍රමවේදයක් හඳුන්වා දීම පිළිබඳව අධ්‍යයනය කර තිබේද;

(iii) බුලත් වගාව පිළිබඳව පර්යේෂණ කටයුතු සිදු කරනු ලබන්නේද;

(iv) එසේ නම්, එම පර්යේෂණ තුළින් බුලත් වගාවේ උන්නතිය උදෙසා මෑත දී සිදු කර ඇති ප්‍රධානතම සොයා ගැනීම් හෝ නිර්දේශයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5192/'14

14\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලාංකික හා ඉන්දියානු ධීවරයන්ගේ ගැටලු සම්බන්ධයෙන් මෑතකදී පැවති සාකච්ඡාවල ප්‍රගතිය කවරේද;

(ii) එම ධීවර ගැටලුව සම්බන්ධයෙන් රජයේ මැදිහත්වීම කවරේද;

(iii) මේ වන විට ඉන්දියාවේ අන්ද්‍රා ප්‍රදේශයේ රඳවාගෙන සිටින ශ්‍රී ලාංකික ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන් මුදා ගැනීමට රජය විසින් කර ඇති මැදිහත්වීම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ධීවරයින්ට ලබා දුන් ඉන්ධන සහනාධාරය නවතා තිබේ නම්, ඒ වෙනුවට හඳුන්වා දෙනු ලැබූ විකල්ප පැකේජයක් තිබේද;

(ii) එසේ නම්, එය කවරේද;

(iii) එම සහනාධාර පැකේජය සහ ඉන්ධන සහනාධාර ක්‍රමය අතර වෙනස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2734/'12

15\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මැල්සිරිපුර, උස්සාව, ගුරු ඇල අමුණ මගින් වගා කළ හැකි කුඹුරු අක්කර සංඛ්‍යාව කොපමණද;

(ii) එම අමුණ මගින් යැපෙන ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මේ වන විට ඉහත සඳහන් ගුරු ඇල අමුණ කැඩී ගොස් ඇති අතර ඒ යටතේ වගා කටයුතු කළ ගොවි පවුල් 500ක් පමණ ජලය නොමැතිව දුෂ්කරතාවයන්ට මුහුණ දී ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) ගුරු ඇල අමුණ ප්‍රතිසංස්කරණය කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කරන මුළු මුදල කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කරන දිනය කවරේද;

(iv) එම අමුණ ප්‍රතිසංස්කරණය කරන තෙක් දුෂ්කරතාවයන්ට පත්වූ ගොවි පවුල්වලට වන්දි මුදලක් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විසර්ජන පනත් කෙටුම්පත (2015) — (දෙවැනි වෙන් කළ දිනය) — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2014 ඔක්තෝබර් 24) [1]

*2.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2014 අගෝස්තු මස 07) [1]

*3.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජුලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*9.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*12.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1999 අංක 38 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2013.09.04 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2013.09.13 දින සලකා බලන ලදී.)

*13.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1983 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ 2013.11.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.07 දින සලකා බලන ලදී.)

*14.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2014.01.21 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.04.24 දින සලකා බලන ලදී.)

*15.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 (2) වගන්තිය යටතේ 2013.10.10 දින ඉදිරිපත් කරන ලද 2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*16.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*17.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*18.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනතේ 37(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*19.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*20.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතන පනතේ 36(4) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*21.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව - 2011,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*22.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව - 2011,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරිය පනතේ 34(2) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*23.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*24.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව - 2011,— 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ 27 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*25.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

26.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

27.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

28.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

29.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

30.

කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

31.

සිව්මුනි සෑ වෙහෙර බෞද්ධ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

32.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---